## කනෙන් කියවෙන දේ

කාන්තාවකට ප්‍රමාණයට වඩා ඉතා සිහින්ව දිගටි කන් පිහිටියේ නම් ඉන් කියවෙනුයේ ප්‍රඥාවන්ත බවයි. මොවුන් සහජයෙන්ම බුද්ධිමත්ය. තම ජීවිත කාර්‍යාවලිය ඉතාම ක්‍රමානුකූලව අනුපිළිවෙලට ගොඩ නැංවීම සඳහා කලාන්තරයක් තිස්සේ සැලසුම් කරන මොවුන් දැඩි උත්සහ වන්තයන්ය.

යම් කාන්තාවකට විශාල කන් පිහිටියේ නම් ඇය වාසනාවන්තයැයි පැරණි පොත පතෙහි එයි. විශේෂයෙන්ම ඉන් දීර්ඝායුෂ ගැන කියවේ. ධනය රැස් කිරීමෙහි මනා දක්‍ෂතාවයක් ඇති මේ ගනයේ කාන්තාවේ වැඩි දරු සම්පත් ලබති. එමෙන්ම උසස් පුද්ගලයන් ආශ්‍රය කිරීමටද ඔවුන්ට නිතර නිතර අවස්ථාව සැලසේ. වැඩිදුර අධ්‍යාපනයක් නොලැබුවද, උසස් ලෙෂ වැදගත් මට්ටමකින් ජීවත්වීමේ භාග්‍ය මේ කතුනට ඇත.

ලොකු වුවද තුනට හතරට බෙදී ගිය ආකාරයට හෙවත් ස්භාවිකත්වයෙන් බැහැරව කන් පිහිටා ඇත්නම් ඒ යහපත් නොවේ. ඇද කුද සහිත කන් ඇති කතුන් වංකව, අනුන් රවටා තලා පෙලා තම අදහස් මුදුන් පමුණුවා ගනිති. එමෙන්ම තමා වෙත නැති තෙජවන්තභාවයක්, උසස් බවක් අඟවා, අනන්‍යන් පසුබස්සවා ඉහළින් සිටීමට සෑම විටම සිතයි. ක්‍රියාකරයි.

මීයන්ගේ වැනි කුඩා කන් පිහිටා ඇත්තේ නම් ආත්ම විශ්වාසයෙන් තොරය. කිසියම් කාර්යයක් ස්ථිර විශ්වාසයෙන් යුතුව කිරීමේ හැකියාවක් ඔවුන් තුළ නැත. තමාට ''බැහැ'' යන මතය සිතෙහි රැඳවා ගෙන සිටින බැවින් අනුන් ලවා සියල්ල කරවා ගැනීමට බලයි. මෙවැනි කතුන් සෑම විටම වාහේ කම්මැලිය.

දවසේ වැඩි කාලයක්ම යම් යම් නිර්තක දැයෙහි යෙදී සිටිමින් කාලය ගත කිරීමටය ඔවුන් සිතනුයේ. එහෙත් කුඩා කන් ඇත්තිය කිසිදාක දුක් විඳීමකට හෝ කරදරයකට පත් නොවේ. අන්‍යයන්ගේ ඇනුම් බැනුම් දෝෂාරෝපණ මධ්‍යයේ වුවද හොඳින් සැපවත්ව ජීවත් වෙයි. කොටින්ම මොවුන් අතපය නොසොල්ලා සැප විඳින කණ්ඩාමකි.

ප්‍රමාණයට වඩා ඉතා සිහින්ව දිගටි කන් පිහිටියේ නම් ඉන් කියවෙනුයේ ප්‍රඥාවන්ත බවයි. මොවුන් සහජයෙන් බුද්ධිමත්ය. තම ජීවිත කාර්යාවලිය ඉතාම ක්‍රමානුකූලව අනුපිළිවෙළට ගොඩනැංවීම සඳහා කාලාන්තරයක් තිස්සේ සැලසුම් කරන මොවුහු දැඩි උත්සාහවන්තයෝය. යමක් ගැන සිතාබලා නියම වැටහීමක් ඇතිව විනා කිසිවක් නොකරති. මොවුන් ආශ්‍රය කරන්නේ ඉතා සුලු පිරිසකි. ඒසුළු පිරිස විවෘත හෘදයෙන් ඉතාම සමීපව ආශ්‍රය කරන අතර අන්‍යයන් හා ගැටීමට අකමැතිය. සෑම වටම ඇසුරු කිරීමට බලාපොරොත්තු වන්නේ තමාට වඩා ඉහළ මට්ටම් සිටින අයයි. එහෙත් පීඩිත පංතියේ ජනතාව කෙරෙහි අනුකම්පා දක්වයි.

ආගමික වශයෙන් මෙලොවට වඩා පරලොව ගැන විශ්වාස කරති. එමෙන්ම ජීවිතියේ අවසානය දක්වාම ඇසූ දුටු දෙයින් යමක් උගෙන තම දැනුම වර්ධනය කර ගැනීම මොවුන්ගේ යහගුණයකි. එහෙත් ඉන් නියම ප්‍රයෝජන ගැනීම නම් සියයට සියයක්ම සාර්ථක නොවේ වෙනත් ලෙසකින් කියතොත් සියල්ල හදාරා ජීවිතය සැපවත් කර ගැනීමට අදහස් කළ ද අවසානය දක්වාම ඔවුන් තුළ ඇත්තේ ඒ ක්‍රියාවලිය පමණයි. ප්‍රතිඵල ලැබීම තරමක් ප්‍රමාදය. ඒ එසේ වුවද තමා ලබන සාර්ථකත්වය තුළින් මානසිකව සෑහීමකට පත්ව සන්තෝෂ වීමට තරම් හැකියාවක් ඔවුනට ඇත.

කණේ ඇතුල්පැත්ත ඉතා මුදුව නිතර දාඩිය දමන ස්වභාවයක් ඇතිව පිහිටියේ නම් ඒ ඉතාම බුද්ධිමත් කතුන්ය. මේ ලක්ෂණ ඉතාම විරලය යම් යම් විෂයයන් හි පරතෙරෙට යාමේ හා ඒ තුළින් ලෝක පූජිතවීමේ වාසනාව මොවුනට ඇත. එමෙන්ම තර්ක විතර්කයෙහි දක්ෂතා දක්වයි තමා එල්බ ගත් මතයෙහිම පිහිටා ඉන් මානසික තෘප්තියක් විඳීම හැර ශාරීරික වශයෙන් සැප සම්පත් මොවුන් පතන්නේ නැත. සමහර විට ආහාර වත්‍ර වැනි අත්‍යාවශ දෙස කෙරෙහි වුවද දැඩි අවශ්‍යතාවයක් හෝ සැලකිල්ලක් නොදක්වයි. ලද දෙයින් සතුටු වී බාහිර ලෝකය වෙත තම කාර්ය ඉටුකර දීමට මොවුහු නිතර පෙළඹෙති. මෙවන් ඝණයේ කාන්තාවන් උත්තරීතරය.

ජේ. ශිලා වික්‍රමරත්න .



## හපනුන් අතර ශූපනෙක්

### මුහුණට මුහුණ

ශ්‍රීනාත් මද්දුමගේ

VCE විභාගය කියන්නේ උසස් අධ්‍යාපනය හදාරන්න බලාපොරොත් වන දූ දරුවන්ට ඉතාමත් වැදගත් විභාගයක්. ජීවිතයේ එක් කඩඉමක් කිව්වොත් නිවැරදියි. ලංකාවේ අපොස උසස් පෙළ විභාගයට සමාන ඔස්ට්‍රේලියාවේ විභාගය තමයි වීසීඊ. මෙයට අපේ දූ දරුවන් විතරක් නෙයි දෙමාපියන් ද දක්වන්නේ ඉතා දැඩි උනන්දුවක්. ලංකාවේ නම් අපොස උසස් පෙළ අසමත් වුණොත් ඔවුන්ගේ අධ්‍යාපන ගමනට එය විශාල අවහිරයක්. නමුත් ඔස්ට්‍රේලියාවේදී එසේ වෙන්නේ නැහැ. මෙහි තිබෙන අධ්‍යාපන ක්‍රමය අනුව අඩු ලකුණු ගත් ශිෂ්‍යයෙකුට වුවත් උසස් අධ්‍යාපනයට පිවිසෙන්න අවස්ථාව තියෙනවා. මෙවර වීසීඊ විභාගයෙන් අපේ දරුවන් රැසක් ඉතා ඉහළ ලකුණු ලබාගෙන තිබෙනවා. ඒ අතර අද අපි මුහුණට මුහුණ හමුවෙන්නේ ලකුණු 98.8 ක් ගත් කිසර චන්දිම ගලප්පත්ති.

**ශ්‍රීනාත්**
කිසර ඉගෙනගත් පාසල මොකක් ද?
**කිසර**
මං මුලින්ම ගියේ සෙන්ට් මොනිකාස් පාසලටයි. ඉන් පස්සේ ශිෂ්‍යත්ව විභාගයට පෙනී ඉඳලා මෙල්බන් උසස් පාසලට ඇතුලත් වුණා. වීසීඊ විභාගය දක්වා මම ඉගෙන ගත්තෙ මේ පාසලේ.

**ශ්‍රීනාත්**
ඔබ ද පාසලේ වැඩි ලකුණු ගත් ශිෂ්‍යයා.?
**කිසර**
නෑ. තව අය ඉන්නවා. අපේ පාසලේ හුඟ දෙනෙක් වැඩි ලකුණු මේ විභාගයෙන් ලබාගන්නවා.

**ශ්‍රීනාත්**
ඔබේ මේ ලකුණු අනුව අනාගතයේ මොන ක්ෂෙත්‍රයට ද යන්න බලාපොරොත්තු වේන්නෙ?
**කිසර**
මට ලැබිලා තියෙන ලකුණු අනුව මට වෛද්‍ය අංශයෙන් උසස් අධ්‍යාපනය ලබන්න පුලුවන්. මම බලාපොරොත්තු වෙනවා අනාගතයේ වෛද්‍ය අංශයෙන් ඉගෙනගෙන වෛද්‍යවරයෙක් වෙන්න.

**ශ්‍රීනාත්**
පොඩි කාලේ ඉඳන්ම ඒ බලාපොරොත්තුව තිබුණ ද?
**කිසර**
නෑ. එහෙම විශේෂ බලාපොරොත්තුවක් තිබුණේ නෑ. නමුත් වැඩි කැමැත්තක් තිබුණා.

**ශ්‍රීනාත්**
ඔබ මේ විභාගයට සැරසුණේ කොහොම ද?
**කිසර**
විශේෂ සැරසීමක් වුණේ නෑ. පාසලේ වැඩ ටික හරියට කළා. එදිනෙදා වැඩ අතපසු කරන්නේ නැතිව එදාම කළා. පාඩම් වෙනුවෙන් හැම දිනම පැය තුනක් හතරක් වැය කළා.

**ශ්‍රීනාත්**
ඔබ අමතර පන්ති වලට සහභාගි වුණා ද?
**කිසර**
මම ගණිතයට පමණක් අමතර පන්ති වලට ගියා. අනිත් විෂයයන් පාසලෙන් සහ මම ම ඉගෙනගත්තා.

**ශ්‍රීනාත්**
ඔබ මුලු කාලයම පාඩමටම කැප කළා ද?
**කිසර**
මං මුලිනුත් කිව්වෙ. දවසකට පැය තුන හතරකට වඩා ගත කළේ නැහැ. මට එහෙම වැය කරන්න වැඩි කාලයක් තිබුණොත් නැහැ. මගේ පාසල දුර තිබෙන නිසා සෑහෙන කාලයක් ගමනට වැය කරන් වුණා. මම පාන්දර හයට නැගිට්ටා. තාත්තත් එක්ක කාරෙකේ ස්ටේෂමට ගිහිල්ලා කෝච්චියේ ඉස්කෝලෙට යනවා. උදේ හතට ගෙදරින් යන මම ආයේ ගෙදර එන්නෙ පහ මාරට විතර.

**ශ්‍රීනාත්**
පරිබාහිර වැඩ කිසිදෙයක් කළේ නැද්ද?
**කිසර**
මම පරිබාහිර වැඩ හුඟක් කළා. පාසලේ චෙස් ක්ලබ් එකේ සූ ක්ලබ් එකේ ඇනිමේෂන් ක්ලබ් එකේ හිටියා. ඇස්ට්‍රොනොමිකල් ක්ලබ් එකෙත් හිටියා. ඒ එක්කම ටෙනිස් ක්‍රීඩාවත් කළා. නොරිස්බෑන්ක් ටෙනිස් සංගමයට බැඳීලා සෙල්ලම් කරනවා.

**ශ්‍රීනාත්**
මේ පරිබාහිර වැඩ විභාගයට බාධාවක් වුණේ නැද්ද?
**කිසර**
ඒ හැම එකක්ම සැළසුම් සහගතව කරන්න ඕනෙ. පාඩම විතරක්ම කරලා හොඳ ප්‍රතාඵල ලබාගන්න මං හිත්න්නෙ අමාරුයි.

**ශ්‍රීනාත්**
විභාගයට ගෙදර අයගේ බලපෑම කොහොම ද?
**කිසර**
මට කිසිම බලපෑමක් කළේ නැහැ. ඕනෙ තරම් නිදහස දීලා තිබුණා. නමුත් මම ඒ නිදහසින් අයුතු ප්‍රායෝජන ගත්තෙ නෑ. අම්මයි තාත්තයි මාව උනන්දු කළා. විභාගේ අගය ගැන කිව්වා. මං ඒ ගැන වැඩිපුර හිතුවා.

**ශ්‍රීනාත්**
ඔබ රූපවාහිණී සහ පරිගණක ක්‍රීඩා කරන්නැද්ද?
**කිසර**
ඇයි නැත්තෙ. මම මේ සියලුම දේවල් කළා. හැබැයි ගාණකට.

**ශ්‍රීනාත්**
කලා කටයුතු එහෙම කළේ නැද්ද?
**කිසර**
මම කවි සහ කෙටිකතා ලිව්වා. ඒවා පාසලේ පළ කළා. මම කෙටිකතා සහ කවි ලියන්න කැමතියි. මම ලියපු නිර්මාණ හුඟක් තියෙනවා. මම හුඟක් පොත් පත් කියවන්න කැමතියි. පුරුද්දක් හැටියට කියවනවා. ඒක හුඟක් ප්‍රයෝජනවත් වුණා.

**ශ්‍රීනාත්**
පවුලේ විස්තර කොහොම ද?
**කිසර**
තාත්තා ලයනල් ගලප්පත්ති. අම්මා සේපාලි ගලප්පත්ති. නංගිලා දෙන්නා අනුෂි සහ රුෂිනි.

**ශ්‍රීනාත්**
වැඩි ලකුණු ගත් ශිෂ්‍යයෙක් හැටියට අනාගතේ මේ විභාගෙට පෙනී ඉන්න අයට දෙන්න පුලුවන් උපදෙසක් තියෙනවා ද?
**කිසර**
පාසලේ පාඩම් වැඩ ටික එදිනෙදාට කරන්න. පාඩම් කරන්න කාලයක් වෙන් කර ගන්න. විභාගය කියලා ලොකු බරක් ඔලුවට ගන්න එපා. පරිබාහිර වැඩත් ගාණට කරන්න. නමුත් වැඩි අවධානය විභාගයට අදාල දේවල් වලට යොමු කරන්න. පාසලේ වැඩ අතපසු කරන්න එපා.

වීසීඊ විභාගයෙන් වැඩි ලකුණු ගත් කිසර අනාගතයේ මෙවන් විභාග වලට පෙනී සිටින දරුවනට ආදර්ශයක්. ඒ වගේම ඔහුගේ කතාවෙන් තේරුණ එක කාරණයක් තමයි දෙමාපියන්ගෙන් ඔහුට ලැබුණ පිටුවහල. බොහෝ දෙමාපියන් විභාගය වෙනුවෙන් දරුවාට දැරිය නොහැකි තරමේ පීඩනයක් ඇති කරන බව අපට නිතර දකින්න ලැබෙනවා. නමුත් කිසරගේ දෙමාපියන් ඔහු නිසි ලෙස මෙහෙයෙව්වා විනා ඔහුට පීඩනයක් ඇති නොකළ බව අපට පෙනී ගියා. එය අනිත් දෙමාපියන්ටත් වැදගත් පාඩමක් වේ යයි අපි හිතනවා. ඒ එක්කම දරුවන්ටත් විභාගය පිළිබඳව වගකීමක් ඇති බව තේරුම් කර දිය යුතුයි. දරුවන් ද නිදහස අයුතු ලෙස ප්‍රයෝජනයට නොගෙන මෙවන් විභාග වලින් සමත් වුවහොත් මල් ඵල ගැන්වෙන්නේ ඔවුන්ගේම අනාගතය බව සිහි තබා ගත යුතුයි.

කිසරගේ අනාගතය සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වේවා කියා පතනවා. වීසීඊ විභාගයට මුහුණ දුන් අපේ දරු දැරියන් සැමට ඒ සුබ පැතුම පොදුවේ යොමු කරන්නත් මම කැමතියි.